"කුඩ්ඩන්ට-පාතාලයන්ට මරණ දඬුවම අනිවාර්ය කරන්න" යන සිරස්තලය සහිතව ලංකාදීප පුවත්පතේ (පෙබරවාරි 10, 2022) මුල්පිටුවෙහි පළව තිබූ ලිපියකි. "මත්ද්‍රව්‍ය ජාවාරම් ඇතුළු තෝරාගත් සංවිධානාත්මක අපරාධවලට සම්බන්ධ වන පුද්ගලයන්ට අනිවාර්යයෙන්ම මරණීය දණ්ඩනය ක්‍රියාත්මක කළ යුතු" යැයි කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා විසින් පාර්ලිමේන්තුවේදී කළ ප්‍රකාශය පදනම් කරගනිමින් මෙම පුවත වාර්තා වී තිබිණි.

කෙසේ නමුත්, අමාත්‍ය සිල්වාගේ ප්‍රකාශය ඔස්සේ දැකගත හැකි වන්නේ, ඔහු විසින් "කුඩ්ඩා" යන යෙදුම සිය කථාව තුළ භාවිතා නොකළ බවයි.

එසේ නම්,

1) අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වාගේ මුල් ප්‍රකාශය තුළ පවා සඳහන් නොවූ "කුඩ්ඩා" යන යෙදුම ලංකාදීප මුල්පිටුවෙහි සිරස්තලය තුළට පැමිණීම සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

2) ඇතැම් විටකදී මත්ද්‍රව්‍ය ජාවාරම් කරන්නන් හැඳින්වීම සඳහා යොදාගැනුණත්, "කුඩ්ඩන්" වැනි යෙදුමකින් බොහෝ විට හැඳින්වෙන්නේ මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් වන බැවින්, ඒ ඔස්සේ තීව්‍රව එල්ල වන සමාජ ගර්හාව සහ කොන් කිරීම ඔස්සේ, එවැන්නන්ට පුනරුත්ථාපනයට බඳුන් වීමෙන් පසුව පවා නැවත සමාජයට එක් වීමට බාධා නොපැමිණෙන්නේ ද?

3) එසේ නම්, "කුඩ්ඩන්" වැනි යෙදුමක් වෙනුවට මෙම සන්දර්භයේදී වඩාත් යෝග්‍ය වන්නේ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් වැනි යෙදුමක් නොවේද?

ඔබේ අදහස?

අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වාගේ ප්‍රකාශයට ප්‍රවේශය
මෙතැනින්: https://youtu.be/vK3fuur1qUc?t=8093